## ශ්‍රී ලංකාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල යෝජනාව (2013 මාර්තු) අවබෝධ කරගැනීමට මගපෙන්වීමක්

## විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
## 2013 පෙබරවාරි

### එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය යනු කුමක්ද?


එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලය (UNHRC) යනු, ලොව පුරා මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම ශක්තිමත් කිරීමේත්, මානව හිමිකම් උල්ලංඝණය වෙන අවස්ථාවලදී, ඒවා විමසා බලමින් අදාළ නිර්දේශ ඉදිරිපත් කිරීමේත් වගකීම උසුලන, අන්තර් රාජ්‍ය සංවිධානයකි. UNHRC, නිව්යෝක් නුවර එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් තෝරා පත් කරගන්නා සාමාජික රටවල් 47 කින් සමන්විත වෙයි. UNHRC ජිනීවා නුවර සිට ක්‍රියාත්මක වෙයි.

### ශ්‍රී ලංකාව UNHRC හි සාමාජික රටක්ද?

නැත. 2008 එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ පැවති ඡන්ද විමසීමකදී ශ්‍රී ලංකාවට UNHRC හි සාමාජිකත්වය අහිමි විය.

### 2012 මාර්තු මානව හිමිකම් කවුන්සිල සැසිවාරයේදී සිදුවූයේ කුමක්ද?

ශ්‍රී ලංකා ආණ්ඩුව විසින්ම පත් කළ උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම ඇතුළු ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය පිළිබඳව විමසා බැලීම සඳහා, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් සමුළුවේ 19 වන සැසිවාරයේදී ඇමරිකා එක්සත් ජනපදය තවත් රටවල් 40 ක් හා එක්ව 2012 මාර්තු 7 වන දින **''ශ්‍රී ලංකාවේ වගවීම සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම''** නමින් යෝජනාවක් සභා ගත කළේය. 2012 මාර්තු 22 වන දින පක්ෂව ලැබුණු ඡන්ද 24 කින් මේ යෝජනාව සම්මත විය. ඊට එරෙහිව ඡන්ද 15 ක් ලැබුණු අතර, සාමාජික රටවල් 8 ක් ඡන්දය දීමෙන් වැළකී සිටියේය. ඡන්ද විමසීමේදී මේ යෝජනාවට පක්ෂව හා විපක්ෂව ඡන්ද ලැබුණු ආකාරය මේ රූප සටහනින් පිළිබිඹු වෙයි.




සමුළුවේ සාකච්ඡා පැවැත්වෙන අතරතුර, ජිනීවා හි UNHRC ගොඩනැගිල්ල තුළදී ශ්‍රී ලංකාවේ සිවිල් සමාජ ක්‍රියාකාරිකයින්ට ආණ්ඩුවේ නියෝජිතයින් සහ ඔවුන්ගේ සහයට සිටි අය විසින් හිරිහැර සිදු කළ බවට පැමිණිලි ලැබුණි. ආණ්ඩුවේ සහ අනෙක් කණ්ඩායම් විසින් සිවිල් සමාජ නියෝජිතයින්ට හිරි හැර සිදු කිරීම සම්බන්ධයෙන් ලැබුණු වාර්තා පිළිබඳව තම කණස්සල්ල පළ කරමින් UNHRC හි සභාපතිනිය ලෝරා ඩුපුයි ලසරේ මහත්මිය විසින් ප්‍රකාශයක් ද නිකුත් කරනු ලැබීය.

**යෝජනාවෙන් කියා සිටියේ මොනවාද?**

යෝජනාවෙන් විමසා බැලූ ප්‍රධාන කාරණා තුනක් විය.

- පළමුව එය LLRC වාර්තාවේ සාධනීය නිර්දේශ ක්‍රියාත්මක කරන ලෙසත්, සියලුම ශ්‍රී ලාංකිකයින් වෙනුවෙන් සාධාරණය, සමානාත්මතාව, වගවීම සහ ප්‍රතිසන්ධානය තහවුරු කිරීම සඳහා විශ්වසනීය සහ ස්වාධීන ක්‍රියාමාර්ග ආරම්භ කිරීමට අදාළ නෛතික වගකීම් සහ කැපවීම සපුරාලීම වෙනුවෙන් ගතයුතු සියලුම අමතර පියවර ගන්නා ලෙසත් ශ්‍රී ලංකා ආණ්ඩුවට කියා සිටියේය.

- දෙවෙනි ඉල්ලීම වූයේ, LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආණ්ඩුව ගෙන ඇති සහ ඉදිරියේදී ගනු ලබන පියවර පැහැදිලි කිරීමට සහ ජාත්‍යන්තර නීතිය උල්ලංඝණය කිරීම පිළිබඳව එල්ල වී ඇති චෝදනා විමසා බැලීමට විස්තරාත්මක ක්‍රියාකාරී සැලසුමක් හැකි ඉක්මනින් ඉදිරිපත් කරන ලෙසයි.

- තුන්වෙනුව, එම පියවර ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය උපදෙස් සහ තාක්ෂණික සහය ශ්‍රී ලංකා ආණ්ඩුවට ලබා දෙන්නැයි මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලයෙන් (OHCHR) සහ අදාළ විශේෂිත ක්‍රියාපටිපාටීන්ගෙන් ඉල්ලා සිටි අතර, එම සහය පිළිගන්නැයි ශ්‍රී ලංකා ආණ්ඩුවට කියා සිටියේය. එසේම එසේ සහයෝගය ලබාදීම පිළිබඳ වාර්තාවක් මානව හිමිකම් සමුළුවේ 22 වෙනි සැසිවාරයට ඉදිරිපත් කරන්නැයි මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයෙන් ඉල්ලා සිටියේය. විශේෂිත ක්‍රියාපටිපාටීන් යනු තේමාත්මක ක්ෂේත්‍රයන් ( උදා: අධ්‍යාපනය සඳහා ඇති අයිතිය පිළිබඳ විශේෂ නියෝජිත සහ බලහත්කාරයෙන් සිදුකෙරෙන අතුරුදහන් කරවීම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායම) සහ රටවල් ( උදා: 1967 සිට අත් කරගත් පලස්තීන භූමි ප්‍රදේශයන්හි මානව හිමිකම් තත්ත්වය පිළිබඳ විශේෂ නියෝජිත වැනි) සම්බන්ධයෙන් වාර්තා කිරීමට සහ උපදෙස් ලබා දීමට එක්සත් ජාතීන් විසින් පත් කළ විශේෂඥයින්ය.

**ශ්‍රී ලංකාව තුළ, ඇතැම් අය මේ යෝජනාව සම්බන්ධයෙන් සහයෝගය පළකළේත්, ඇතැම් අය ඊට විරුද්ධ වූයේත් ඇයි?**

ශ්‍රී ලංකාව තුළ ඇතැම් පිරිස් මේ යෝජනාව සම්බන්ධයෙන් සහය දැක්වූ අතර තවත් පිරිසක් එයට විරෝධය එල්ල කළහ. මෙකී යෝජනාව මගින් තමන් විසින්ම පත්කළ කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නැංවීමට ශ්‍රී ලංකා ආණ්ඩුව යොමු කරවන බැවින් ඇතැම් දේශපාලන පක්ෂ, සිවිල් සමාජ කණ්ඩායම්, සහ යුද්ධයෙන් බැට කෑ ප්‍රජාවන් ඊට සහයෝගය පළකළහ. ඒ පිරිස් තවදුරටත් මේ යෝජනාවට තම සහය ලබා දෙමින් සිටිති. LLRC අන්තර් වාර නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අන්තර් අමාත්‍ය කමිටුවක් පත්කළ නමුත්, ආණ්ඩුව එම නිර්දේශ ක්‍රියාත්මක කර නැති බව, LLRC අවසාන වාර්තාවේ පවා සඳහන් කර ඇත.

LLRC යට පෙර තවත් එවැනි කමිටු තිබී ඇති අතර ඒවායින් ඇතැම් ඒවා වත්මන් ආණ්ඩුව විසින්ම පත්කළ ඒවාය. ඒ කමිටු විසින් ලබා දුන් වාර්තා ප්‍රසිද්ධියට පත් කර නැත. එසේම ඒවායේ නිර්දේශ ක්‍රියාත්මක කර ඇත්තේද නැත. LLRC අවසාන වාර්තාවේ ඉංග්‍රීසි පිටපත 2011 දෙසැම්බර් මසදී ප්‍රසිද්ධ කෙරුණි. සමස්ත LLRC වාර්තාවේ සිංහල සහ දෙමළ පරිවර්තන නිමා වූයේ 2012 අගෝස්තු මාසයේයි. නමුත් වාර්තාවේ නිගමන මහජනයා අතර ප්‍රසිද්ධ කිරීමට ආණ්ඩුව උත්සහයක් ගෙන නැත. සාමය, මානව හිමිකම් සහ ප්‍රතිසන්ධානය යන තීරණාත්මක කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීමේ ප්‍රගතිය සතුටුදායක නැති බැවින්, එක්සත් ජනපදයේ උක්ත යෝජනාව සම්මත වීම, මේ ක්ෂේත්‍රයන්ගේ ප්‍රගතියක් අත්කරගැනීමට පහසුකම් සැලසීමක් වනු ඇතැයි පිළිගැනුණි.

ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට ඇඟිලි ගැසීමක් ලෙස හුවා දක්වමින්, ආණ්ඩුව, ඇතැම් දේශපාලන පක්ෂ සහ සිවිල් සමාජ කණ්ඩායම් මේ යෝජනාව විවේචනය කළ අතර ඊට විරෝධතාව දැක්වූහ. මානව හිමිකම්, සාමය, සහ ප්‍රතිසන්ධානය පිළිබඳ කටයුතු කිරීමට ආණ්ඩුව නොයෙකුත් පියවරයන් ගෙන ඇති බවත්, බාහිර බලපෑම් මගින් මෙතෙක් ගෙන ඇති පියවරයන්ට නිශේධනීය බලපෑමක් එල්ල වනු ඇති බවත් ඇතැම් අය කියා සිටියහ. **ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට**

**බාහිර මැදිහත්වීම් ඇති වීමට ඉඩ සලසන කිසිදු විධිවිධානයක් යෝජනාවේ ඇතුළත් වන්නේ නැත.** ඒ වෙනුවට එහි ඇත්තේ, ලංකාණ්ඩුවට තම වගකීම් සපුරාලීමට සහය දෙන විධිවිධානය. LLRC නිර්දේශ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කිරීම සඳහා මානව හිමිකම් මහ කොමසාරිස් කාර්යාලයෙන් සහ එක්සත් ජාතීන්ගේ ඇතැම් සාමාජික රටවලිනුත්, අනෙක් ක්‍රියාපටිපාටින්ගෙනුත් තාක්ෂණික සහයෝගය ලබාගත හැකි විධිවිධාන යොජනාවේ ඇතුළත් වෙයි. ආණ්ඩුවේ ඇතැම් දේශපාලන පක්ෂවල ආස්ථානය වූයේ, ඇමරිකා එක්සත් ජනපදය ගෙනා යෝජනාවට සහය දක්වන අය ශ්‍රී ලංකාවට එරෙහි වන්නන් බවයි. ඔවුහු ද්‍රෝහීන් නමින් හඳුන්වනු ලැබූහ.

**යෝජනාව ගෙන ආ දාසිට ආණ්ඩුව කර ඇත්තේ මොනවාද?**

ආණ්ඩුව 2012 මැයි මසදී, LLRC නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කාර්ය සාධන බලකායක් පත්කළ බව ප්‍රකාශයට පත් කළ අතර, කොමිසමේ නිර්දේශ ක්‍රියාවට නැංවීමට ජාතික ක්‍රියාකාරී සැලැස්මක්ද නිකුත් කළේය. මේ සියල්ලම ආණ්ඩුව විසින් ගත් සාධනීය ක්‍රියාමාර්ගය. අදාළ ක්‍රියාකාරකම්, ඒවා ක්‍රියාත්මක කරවන පාර්ශවයන් සහ කාල රාමුවක් (මාස 3 සිට 36 දක්වා පරාසයක) ඉදිරිපත් කරන එම ජාතික ක්‍රියාකාරී සැලැස්මට 2012 ජුලි මාසයේදී **කැබිනට් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දෙන ලදි.** කෙසේ වෙතත්, LLRC කමිටුව විසින් යෝජනා කළ නිර්දේශ අතුරින් ක්‍රියාත්මක කිරීම සඳහා නිර්දේශ තෝරාගෙන ඇති ආකාරය සහ යෝජිත ක්‍රියාකාරකම් සහ සැබෑ ප්‍රශ්නය අතර සම්බන්ධයක් නොමැතිකම ඇතුළු ගැටලු ගණනාවක් ජාතික ක්‍රියාකාරී සැලැස්ම සම්බන්ධයෙන් ඉස්මතු වී ඇත.

ආණ්ඩුව 2012 මාර්තු මසදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් මහ කොමසාරිස් නවි පිල්ලෙයි මහත්මියට ලංකාවට පැමිණෙන්නැයි ආරාධනා කළේය. මානව හිමිකම් මහ කොමසාරිස්තුමිය තත්ත්වය විමසා බැලීම සඳහා ඇගේ කාර්යාලයේ දූත කණ්ඩායමක් 2012 සැප්තැම්බර් මසදී මෙරටට එවීය. සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විත වූ එම දූත කණ්ඩායම උතුරේ සංචාරය කළ අතර, ආණ්ඩුවේ නිලධාරීන්, දේශපාලන පක්ෂ නියෝජිතයින්, සහ සිවිල් සමාජ සාමාජිකයින් සමග කොළඹදී සාකච්ඡා පැවැත්වූහ. එම දූත ගමනේ සොයාගැනීම් ඇතුළත් වාර්තාවක් දැන් ප්‍රකාශයට පත් කර ඇති අතර, මානව හිමිකම් මහ කොමසාරිස්වරිය විසින් UNHRC හි 22 වන සැසිවාරයට එය ඉදිරිපත් කරනු ඇත.

**මේ UNHRC සැසිවාරයේදී ශ්‍රී ලංකාවේ තත්ත්වය සාකච්ඡාවට ගනියිද?**

**ඔව්. 2013 පෙබරවාරි 25 සිට මාර්තු 22 දක්වා පැවැත්වෙන** UNHRC හි 22 වන සැසිවාරයට මානව හිමිකම් මහ කොමසාරිස්වරිය විසින් සිය වාර්තාව ඉදිරිපත් කිරීමට නියමිතය. 22 වන සැසිවාරයේදී ශ්‍රී ලංකාව පිළිබඳ ඉදිරිපත්වන යෝජනාවකට තම සහය පළකරන බවට ඇමරිකාව සහ අනෙක් සාමාජික රටවල් ප්‍රකාශ කර ඇත.

**මහ කොමසාරිස්වරියගේ වාර්තාවේ ඇතුළත් වන්නේ මොනවාද?**

මානව හිමිකම් මහ කොමසාරිස්වරිය විසින් පෙබරවාරි 11 වෙනි දින නිකුත් කළ වාර්තාවෙන් LLRC නිර්දේශ ක්‍රියාත්මක කර ඇත්ද නැත්ද යන්නත්, ඒවා ක්‍රියාත්මක කිරීමට ආණ්ඩුව සැලසුම් කරන්නේ කෙසේද යන්නත් විමසා බැලෙයි. එසේම එම වාර්තාව මගින් සලකා බැලීම සඳහා නිර්දේශද ඉදිරිපත් කරයි. වාර්තාව සකස් කොට ඇත්තේ, මහ කොමසාරිස්වරිය විසින් එවූ දූත කණ්ඩායමේ නිරීක්ෂණ සහ තාක්ෂණික සහය ලබාගත හැකි ක්ෂේත්‍ර මොනවාදැයි යෝජනා කරමින් 2012 වසරේදී ඇය විසින් ශ්‍රී ලංකා ආණ්ඩුවට එවූ ලිපිය පදනම් කරගෙනයි. ආණ්ඩුව විසින් මීට පෙර කියා ඇති පරිදි, **වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ පනත** වැනි පනත් සම්මත කිරීම සහ ඇතැම් විශේෂිත නියෝජිතයින් ලංකාවටට පැමිණීමට කළ ඉල්ලීම්වලට යහපත් ප්‍රතිචාර දැක්වීම ආදිය ඇතුළත් නිර්දේශ ගණනාවක් මේ වාර්තාව මගින් ඉදිරිපත් කරයි.

(මානව හිමිකම් මහ කොමසාරිස්ගේ වාර්තාව සඳහා *http://www.ohchr.org/Documents/HRBodies/HRCouncil/RegularSession/Session22/A-HRC-22-38_en.pdf* වෙත පිවිසෙන්න. )